පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 07 |

## අවසාන වාර පරීක්ෂණය - 2019

විෂයය - ගණිතය

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..................................................

..................................................

කාලය : පැය 02 යි.

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. පැත්තක දිග 5 $cm$ ක් වන ඝණකයක් රූපයේ දැක්වේ. එහි පරිමාව සොයන්න.




02. ලකුණු කර ඇති දත්ත අනුව මෙම ත්‍රිකෝණය කවර වර්ගයට අයත්වේද?.



03. $2^3 \times 3$ විහිදුවා ලියා අගය සොයන්න.

04. $4x + 2x - x$ සුළු කරන්න.

05.




දී ඇති රූපයේ $P\hat{Q}R$ හි අගය මැන ලියන්න

06. $\frac{4}{5}$ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

07. $6 + 4 \div 2 =$ ............. සුළු කරන්න.

08.




ඉහත සංඛ්‍යා රේඛාව ඇසුරෙන් පහත හිස්තැන් පුරවන්න.

$(+3) +$.................. =............................

09. භාජනයේ ජල පරිමාව $ml$ වලින් දක්වන්න.




10. ද්විපාර්ශ්වික සමමිතික රූපයක් ලැබෙන සේ මෙම රූපය සම්පූර්ණ කරන්න.



11. $2x + 3 = 5$ යන සමීකරණය ගොඩනැඟීම සඳහා දී ඇති ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.




12. 30, 18 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

13. ක්‍රි.ව. 2000 - ක්‍රි.ව. 2019 , ක්‍රි.ව. 2100, ක්‍රි.ව. 2400 යන වර්ෂ අතරින් අධික අවුරුදු වන වර්ෂ දෙක තෝරා ලියන්න.

14. $2m\ 5cm + 3m\ \ 8cm\ \ = ..........m.............cm$ හිස්තැන් පුරවන්න.

15. රොම්බසය සවිධි බහු අස්‍රයක් නොවේ. එයට හේතුව සඳහන් කරන්න.

16. පරිමිතිය $20cm$ වන සමචතුරස්‍රයක
   i. පැත්තක දිග සොයන්න.
   ii. සමචතුරස්‍රයේ වර්ගඵලය ගණනය කරන්න.

17. 34☐6යන සංඛ්‍යාව ඉතිරි නැතිව 3 න් හා 4 න් බෙදේ නම් හිස් කොටුවට ගැළපෙන ඉලක්කම ලියන්න.

18. ලකුණු 25 ක් ලබාදෙන ප්‍රශ්න පත්‍රයකට සුධීර ලකුණු 18 ක් ලබා ගත්තේය. සුධීර ලබාගත් ලකුණු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

19. $AB$ සරල රේඛා ඛණ්ඩයට සමාන්තර සරල රේඛා ඛණ්ඩයක් ඇඳ එය සමාන්තර වන බව ලකුණු කරන්න..




20. අහඹු සිදුවීමක් සඳහා සුදුසු උදාහරණය තෝරා යටින් ඉරක් අඳින්න.
   i. කාසියක් උඩ දැමූ විට සිරස ලැබීම.
   ii. මුහුණත් 1,2,3,4 ලෙස අංක කරන ලද චතුස්තලයක් උඩ දැමීමේදී අංක 6 සඳහන් මුහුණත වැටීම.
   iii. රබර් බෝලයක් ජලයේ පාවීම.

# II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01.

a.

i. $x$ අක්ෂය දිගේ ඒකක 06 ක් ද $y$ අක්ෂය දිගේ ඒකක 6 ක් ද වන සේ කාටීසීය තලයක් අඳින්න. (02)

ii. පහත දක්වාඇති ලක්ෂ්‍ය එම කාටීසීය තලය මත ලකුණු කරන්න. (04)

$P\ (1\ ,1)$ $Q\ (1\ ,5)$ $R\ (5\ ,5)$

$S\ (5\ ,3)$ $T\ (3\ ,\ 3)$ $U\ (3\ ,\ 1)$

iii. $P, Q, R, S, T, U$ අනුපිළිවෙලින් යා කර සංවෘත්ත රූපයක් ලබා ගන්න. (01)

iv. එම රූපයේ සමමිතික අක්ෂය ඇඳ දක්වන්න. (01)

v. අඳින ලද සමමිතික අක්ෂය$x$ හා $y$ අක්ෂ හමු වන සේ දෙපසට දික් කරන්න. (01)

vi. $x$ හා $y$අක්ෂ ඡේදනය වන ලක්ෂ්‍යය පිළිවෙලින් $A$ හා $B$නම් $A$ හා $B$ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ලියා දක්වන්න. (02)

b. කාටීසීය තලයේ ඒකක දෙකක් අතර දුර $1\ cm$ ක් ලෙස සලකා $P, Q, R, S, T, U$ තල රූපයේ වර්ගඵලය ගණනය කරන්න. (02)

c. ඉහත ඔබ ලබාගත් සංවෘත්ත රූපය, ආකාරයේ බිම අතුරන කොන්ක්‍රීට් කැට 4ක් සපයා ඇත්නම් කැට 4ම භාවිතයෙන් නිර්මාණය කළ හැකි ටෙසලාකරණයක් ඇඳ දක්වන්න. (03)

02.

a.

i. $\frac{2}{3}$ , $\frac{3}{7}$ යන භාග දෙක $>$ , $<$ යන සංකේත යොදමින් සංසන්දනය කරන්න. (02)

ii. $2\frac{2}{5}\ +\ 1\frac{1}{4}$ සුළු කරන්න. (03)

iii. තීන්ත $4\,\ell$ ක ටින් එකකින් $1\frac{1}{4}\ \ell$ ක් භාවිතා කළේ නම් ඉතිරි තීන්ත ප්‍රමාණය කොපමණද? (02)

b.

i. $2\ :\ 4\ :\ 5$ ට තුල්‍ය අනුපාතයක් ලියන්න. (02)

ii. $A$ , $B$ හා $C$ අතර මුදලක් බෙදෙන ලද්දේ $2\ :\ 5\ :\ 3$ ට නම් $B$ට ලැබුණු මුදල රුපියල් 700/-ක් නම් $C$ට ලැබුණු මුදල සොයන්න. (02)

03.

a.

i. පැත්තක දිග $4cm$ ක් වන සේ සමචතුරස්‍රයක් ඇඳ එය $A, B, C, D$ලෙස නම් කරන්න. (02)

ii. එම සමචතුරස්‍රයේ සෑම පාදයක් මතම කවකටුව භාවිතයෙන් සමපාද ත්‍රිකෝණය බැගින් ත්‍රිකෝණ 4ක් නිර්මාණය කරන්න. (03)

iii. එවිට ලැබෙන සංයුක්ත රූපය සුදුසු පරිදි ඇලවුම් වාසි යෙදූපසු පතරමක් ලෙසගෙන සෑදිය හැකි ඝන වස්තුව කුමක්ද? (01)

b.

i. ඉහත ඔබට ලැබුණු ඝන වස්තුවේ දාර, මුහුණත්, ශීර්ෂ ගණන වෙන වෙනම ලියන්න. (03)

ii. එම ඝන වස්තුව ඔයිලර් නියමය පිළිපදින බව ඔයිලර් සමීකරණ ඇසුරින් පෙන්වන්න. (02)

04.

a. පහත දක්වා ඇත්තේ එක්තරා ඉඩමක බිම් සැලැස්මේ පරිමාණ රූපයකි.




i. එම පරිමාණ රූපයේ පරිමිතිය සොයන්න. (02)

ii. පරිමාණ රූපයේ වර්ගඵලය සොයන්න. (03)

b.

i. ඉහත රූපයේ $1cm$ කින් සැබෑ දිග$2m$ ක් දක්වයි නම් එම පරිමාණය අනුපාතයක් ලෙස දක්වන්න. (02)

ii. ඉහත පරිමාණයට අනුව ඉඩමේ සැබෑ පරිමිතිය ගණනය කරන්න. (02)

iii. එම ඉඩම වටා $2m$ක පරතරයක් සිටින සේ කොන්ක්‍රීට් කණු සිටුවීමට අදහස් කරයි නම් අවශ්‍ය කණු ගණන කොපමණද? (02)



scan by Asela Nissanka _ Kekirawa_0716341436

05.

a.

i. පහත දක්වා ඇති වගන්ති උත්තර පත්‍රයේ පිටපත් කරගෙන ඒවා අතරින් කුලකයක් නිශ්චිතව අර්ථ දක්වන ප්‍රකාශය ඉදිරියෙන් ලකුණ ✓ ද එසේ නොවේ නම් ලකුණ × ද යොදන්න. (ල 03)

(අ) ඔබේ පංතියේ ලස්සන ළමයි

(ආ) ඔබේ ගමේ මාසික ආදායම රුපියල් 35 000.00 ට වැඩි පුද්ගලයින්

(ඇ) ඔබේ ගමේ පොහොසත් පුද්ගලයින්

ii. A = {ධන නිඛිලය} යන කුලකය අවයව සහිතව ලියා දක්වන්න. (ල 01)

B = {1 සිට 5 දක්වා පූර්ණ සංඛ්‍යා} යන කුලකය වෙන් රූපයකින් දක්වන්න. (ල 02)

C = {*KABITHIGOLLAWA* යන වචනයේ අකුරු} යන කුලකයේ අවයව ලියන්න. (ල 01)

b. එකක් රුපියල් $x$ බැගින් වූ දොඩම් ගෙඩි 5 ක් ද, එකක් රුපියල් 35.00 බැගින් වූ ඇපල් ගෙඩි තුනක් ද මිලට ගැනීමට රුපියල් 305.00 ක් අවශ්‍ය වේ.

i. ඉහත තොරතුරු ඇසුරින් $x$ අඩංගු සරළ සමීකරණයක් ගොඩනගන්න. (ල 01)

ii. එම සමීකරණය විසඳීමෙන් දොඩම් ගෙඩියක මිල සොයන්න. (ල 03)

06. එක්තරා ග්‍රාමීය ප්‍රදේශයක ආසන්න වර්ෂ 4ක වසංගත රෝග පිළිබඳ කළ සමීක්ෂණයකදී අනාවරණය වූ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | රෝගීන් ගණන | |
|---|---|---|
| | මැලේරියාව | ඩෙංගු උණ |
| 2015 | 50 | 25 |
| 2016 | 40 | 40 |
| 2017 | 20 | 50 |
| 2018 | 05 | 60 |

i. ඉහත දත්ත සුදුසු බහු තීර ප්‍රස්තාරයක් මඟින් නිරූපණය කරන්න. (ල 06)

ii. වාර්ෂිකව රෝගීන් ගණනවැඩි වී ඇත්තේ කුමන රෝගයේද? (ල 01)

iii. මැලේරියා රෝගය සාර්ථකව මර්ධනය කරමින් පවතින බව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පවසයි. එම කියමන හා ඔබ එකඟ වන්නේ ද හේතුව සඳහන් කරන්න. (ල 02)

iv. 2018 වර්ෂයේදී ඩෙංගු රෝගය වැළදෙන රෝගීන් ගෙන් තිදෙනෙකු මිය ගියේනම්, එම වර්ෂයේදී ඩෙංගු රෝගීන්ගෙන් මිය ගිය රෝගීන්ගේ ප්‍රතිශතය කොපමණද? (ල 02)

MATHS PAPERS.INFO



ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න